**රිදීගම ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රිදීගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ලිහිණිවැහැර හොලොන්ගොල්ල වත්ත ඉඩම වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ඉවත් කිරීම් රු.630,000 ක් වුවත් එය රු.360,000 ක් ලෙස රු.270,000ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු අරමුදල් ණයහිමියෝ රු.17,890,102ක් වුවත් එය රු.18,890,020ක් ලෙස රු.999,918 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 06 ක ආදායම රු.5,605,450 ක් වැඩියෙන්ද ආදායම් විෂයයන් 02 ක ආදායම රු.143,027 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදුකුලී ආදායම රු.179,808 ක් වැඩියෙන් ද ආදායම් විෂයයන් 02ක ලැබිය යුතු ආදායම රු.11,322,316 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක රු.1,359,281 ක වටිනාකමක් ගිණුම්ගත කර නොතිබුණි.<br><br>(උ) ඉකුත් වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදලට වඩා සමාලෝචිත වර්ෂයේ ලද රු.940,375 ක් උසාවි දඩ ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,974,496 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,117,239 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් හා බදු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 1,655 කින් රු.3,314,754 ක මුදලක් අයකර නොතිබුණි. | ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් අයකර ගැනීමට කටයුතු කරන බවත් විගණනය වෙත කාරුණිකව දන්වා සිටිමි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| කුලී | | |
| කඩකාමර 13 කින් එකවර ගෙවීම් මුදල් (Key Money) රු.8,576,500 ක මුදල් අයකරගෙන නොතිබුණි. | හිඟහිටි මුදල් ලබාගැනීම සඳහා බදුකරුවන් 2022 ජනවාරි 08 හා 2022 මැයි 08 දිනැති ලිපි මගින් දැනුවත් කර ඇති බවත්, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් විගණනය වෙත දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව එකවර මුදල් ලබාගත යුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලිහිණිවැහැර පදිංචි අයෙක් අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ලක් සඳහා දඩ මුදල් වශයෙන් රු. 1,170,000 ක මුදලක් ගෙවා සැලැස්මට අනුමැතිය ලබාගන්නා ලෙස 2014 සැප්තැම්බර් 16 දිනැති ලිපියෙන් දන්වා යවා තිබුණද, එම දඩ මුදල් අයකරගෙන නොතිබුණි. | සභාව විසින් 2022 ජනවාරි 05, ජනවාරි 21, ජනවාරි 31 දිනැති ලිපි මගින් දැනුවත් කිරීමෙන් අනතුරුව ඔහු විසින් එම දඩ මුදල ගෙවීමට නොහැකි බව දන්වා 2022 ජනවාරි 28 දිනැතිව ලිඛිත දැනුවත් කිරීමක් අප වෙත සිදුකර ඇති බවත්, ඒ අනුව මෙම ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම හා දඩ මුදල ගෙවීම සම්බන්ධයෙන් මහ සභාවට ඉදිරිපත් කළ අතර, මහ සභාවේ තීරණය පරිදි ඉදිරි කටයුතු සිදුකරන බව විගණනය වෙත දන්වා සිටිමි. | නීති, රීති අනුව සැලසුම් අනුමත කරවා නොගෙන සිදුකළ ඉදිකිරීම් සඳහා දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රිදීගම ප්‍රාදේශීය සභාව සතු රු.76,000 ක් වටිනා ගස් කපන යන්ත්‍රය 2018 මැයි 21 දින සිට අස්ථානගත කර ඇතත් ඒ සම්බන්ධ පාර්ශවයන් අනාවරණය කරගෙන විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2021 අප්‍රේල් 21 දින ගොකරැල්ල පොලිසියේ පැමිණිල්ලක් ගොනුකල අතර, එම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා පොලිසිය විසින් විමර්ශනයක් කිරීමෙන් පසු යන්ත්‍රයේ වටිනාකම සභාව වෙත ගෙවීමට එකඟ වුවද අයකරගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් අස්ථානගත වූ විට පරීක්ෂණ පවත්වා අලාභ අයකර ගත යුතු වේ. |

**3.3 දෘශ්‍ය අක්‍රමිකතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.2,032,000 ක් වැයකර සභාව සතු ටේලර් 04 ක් අලුත්වැඩියා කර තිබුණි. ආයතන 03 ක මිල ගණන් මත මෙම අලුත්වැඩියාව සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල අදාල ආයතන වලට ගොස් සිදුකල භෞතික පරීක්ෂාවේ දී ලංසුකරුවන් දෙදෙනෙකුට යැවූ මිල ගණන් එම ආයතනවලට ලැබී නොතිබුණු බවත්. එක් ආයතනයක මිල ගණන්වල ඇස්තමේන්තු ලිපි ශීර්ෂයේ මුද්‍රිත අංක මකන දියර වලින් ඉවත්කර සාවද්‍ය ලිපි ශීර්ෂ සකස්කර ට්‍රැක්ටර් ටේලර් 4 සඳහාම ලංසු 4 ක් | අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි ආයතනයක් ඉදිරිපත් කර තිබූ මිල ගණන් යටතේ අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කළ බව විගණනය වෙත දන්වා සිටිමි. | (i)<br><br><br><br><br><br><br>(ii) | භාණ්ඩ වැඩ හා සේවා ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන අරමුණු ඉටුවන ලෙස කටයුතු කළ යුතු වේ.<br><br>මෙම අක්‍රමිකතාවය සම්බන්ධයෙන් ආයතය සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව වගකිවයුතු |

| | | | |
|---|---|---|---|
| | සකස් කර තිබූ බවත් අත් අකුරු එකම ස්වරූපයේ අකුරු බවද විගණනයට සනාථ විය. | | නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට පොදු කටයුතු සඳහා පවරා දුන් ඉඩම් කොටස් වෙන්කර ඇත්තේ එම වෙන්දේසි ඉඩම්වල ජීවත්වන ජනතාවගේ පොදු පහසුකම් සඳහා වුවද, එම අරමුණුවලින් බැහැරව කන්තෝරුවත්ත මඩිතියාව පොදු ඉඩමේ කට්ටි අංක 07 කොටසින් පර්චස් 9.1 ක භූමි ප්‍රමාණයක් යාබද කට්ටි ඉඩම් හිමියා විසින් නිවසක් ඉදිකර තිබුණි. සභාව විසින් මෙම පර්චස් 9.1 ක ඉඩම් කොටස මහා සභා තීරණයක් ගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන රු.227,000 ක මුදලකට තක්සේරුකර බැහැර කිරීමට කටයුතු කර තිබුණි. | පොදු කටයුතු සඳහා කට්ටි අංක 7,08,11 යන කොටස් මගින් පර්චස් 39.8ක් ප්‍රාදේශිය සභාව වෙත ලබාදී ඇත. පුද්ගලයෙක් සභාව සතු කට්ටි අංක 7ට අදාළ ඉඩම් කොටසේ කොටසක්ද ඇතුළත්ව නිවස ඉදිකර ඇති අතර මහා සභා අනුමැතිය මත කඩයිම මගින් අනුමැතිය ලබාගෙන තක්සේරු කර මුදල අයකර පර්චස් 9.1ක බිම් ප්‍රමාණයක් නිදහස් කර ඇත. | පොදු ඉඩම් වෙන්කර ඇත්තේ එම ඉඩම්වල පදිංචිකරුවන්ගේ පොදු කටයුතු සඳහාය. එම ඉඩම් තක්සේරුකර බැහැර කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | ගොඩදළුපොතේ වත්ත ඉඩම් කොටස්වලින් අංක 26 දරණ පර්චස් 13 ක ඉඩමේ නිවසක් ඉදිකර ඇත. ඉඩම් වෙන්දේසිකරු විසින්ම මෙම කොටස විකුණා මුදල් ලබාගත් බව විගණනයට නිරීක්ෂණය වූ අතර, මෙම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙස ලිඛිතව දන්වා ඇතත්,මේ දක්වා එම ඉදිකිරීම් ඉවත් කර නොමැති බැවින් මේ සම්බන්ධව මහ සභාව දැනුවත් කර ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමුකර ඇති බව විගණනය වෙත දන්වා සිටිමි. | පොදු ඉඩම් ආරක්ෂා කිරීමට සභාව ක්‍රියාමාර්ග ගතයුතු වේ. අනවසර අල්ලා ගැනීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | වජිරවත්ත වෙන්දේසි ඉඩමෙන් පොදු කටයුතු සඳහා අක්කර 04 රූඩ් 01 පර්චස් 2.47 ලබාදිය යුතු වුවත් රූඩ් 01 පර්චස් 3.9 ක ප්‍රමාණයක් අඩුවෙන් ලබාදී තිබූ අතර, මෙම වෙන්දේසි ඉඩම සඳහා කාණු පද්ධතියක් නොමැති වීම, ජල පහසුකම් හා විදුලි බලය සපයා දී නොතිබුණි. පාරවල් තාර දමා විධිමත්ව සකස් කර නොතිබුණද සභාවේ නිලධාරින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාවට ලැබිය යුතු බිම් ප්‍රමාණය වන අක්කර 04 රූඩ් 01 පර්.2.47ක ප්‍රමාණය නිවරැදි කර ඇති බවත්,මෙම ඉඩම් වෙන්දේසිය දෝෂ සහ අඩුපාඩු සහිත බැවින් ඉඩමේ කට්ටි සැලැස්ම මේ දක්වා අනුමත කර නොමැති බවත් විගණනය වෙත දන්වා සිටිමි. | ඉඩම් වෙන්දේසි අනුමත කිරීමෙන් පසු සභාවට පැවරිය යුතු ඉඩම් විධිමත්ව ලබාගෙන යටිතල පහසුකම් සංවර්ධනය කළපසු අනුකූලතා සහතිකය ලබා දීමෙන් පසු ඉඩම් කොටස් විකිණීමට අවසර දිය යුතුවේ. |